

## දක්ෂ ගොවියෝ

# රජයෙන් සම්මාන ලත් දකුණේ ගොවියෙක්

නවීන ගොවිතැනේ හාස්කම් පා රජයෙන් සම්මාන ලත් වීරෝදාර ගොවියෙකු ගැන කතා කරමු.


මාතරට සැතපුම් පහළොවක් ඔබ්බෙහි වූ හක්මණ පැරණි ඉතිහාසයක් ඇති ගමකි. දැනට අවුරුදු විසි තිස් ගණනකට පෙර මැලේරියා උණ එහි රජකම් කළද, දැන් එවැනි ආපදාවක් නැත. ගොවිකම ජීවිකා වෘත්තිය කරගත් ගැමි පිරිසකගෙන් සැදුම් ලත් ඒපෙදෙසෙහි ගොඩ මඩ ඉඩම් සෑහෙන පමණට ඇතත් ගතානුගතික ගොවිතැන් ක්‍රම අනුගමනය නිසා ඉන් නිසි ඵල ලබාගත නොහැකි විය.



2*——ජේ. ඇන්. ආර් 25278 (7/58)

එකල ගමේ පාසැලේ අටවැනි පන්තියේ ඉගෙනීම ලබමින් සිටි තරුණයෙකි. හෙතෙම 1927 වර්ෂයේදී සිය පාසැල් මිතුරන්ට ආයුබෝවන් කියා පාසැලින් අස්ව ගියේ තම පෙදෙසට සවභාව ධර්‍මයා මගින් දී ඇති ධන සම්පත්වලින් සෑබෑ ඵල නෙලා ගන්නා පරම චෙතනාවකිනි. උගෙනීම තවදුරටත් කරගෙන ගියේ නම් රජයේ රැකියාවකට බැඳීමේ වාසනාව ඔහුට තිබුනද හේ නිවහල් ගොවි ජීවිතය ප්‍රිය කළේය. පියා කළ වෙළඳාම පවා ඔහුට රුචි නොවීය. එබැවින් පියා සතු ගොඩ මඩ ඉඩම් වගාකිරීමට හේ ඉටා ගත්තේය. ගමේ සෙසු ගොවියන් මෙන් යල් පැනපු ගොවිතැන් ක්‍රම ම අනුගමනය කරමින් ගොවිතැනෙහි යෙදුනු ඔහුට එදා එකට පහකට හයකට වඩා අස්වැන්නක් ලබාගත නොහැකි විය. දෙවැනි ලෝක මහා සංග්‍රාමය ඇරඹෙත්ම රටේ සහල් හිගයක් ඇතිවිය. එවැනි සමයක හැකිතාක් ආහාර ද්‍රව්‍ය නිපදවීම සෑම රට වැසියෙකුගේම යුතුකමකැයි සිතූ හෙතෙම වඩාත් උනන්දුවී ගොවිතැන් කෙළේය. ගොවිතැනෙහි නියම අගය මෙන්ම රසයද ඔහුට දැනෙන්නට වූයේ එකලය. එහෙත් නවීන ගොවිතැන් ක්‍රම අනුගමනය කරමින් ශාස්ත්‍රානුකූල ගොවිතැන පටන් ගත්තේ 1949 අවුරුද්දෙදී යැයි ඔහු කීවේ ඉමහත් ආඩම්බරයකිනි.


හක්මණ අකුනාදූ වෙල්යාය වපසරියෙන් අක්කර 32 කි. ඉන් අක්කර 12 ක්ම හිමිවූයේ හක්මණ පී. ඩබ්ලිව්. රත්නායක මහතාටය, හෙවත් අපේ මේ වීර ගොවියාටය. 1949 අවුරුද්දේදී ගොවිකම් උපදේශක මහතුන්ගේ උපදෙස් අනුගමනය කරමින් තමන් සතු කුඹුරු යායට පෝර යොදා පැළසිටුවීමෙන් ගොයම් වගා කළේය. මේ නිසා වෙනදාට වඩා දෙගුණයක පමණ අස්වැන්නක් ලබාගත හැකි වූයෙන් ඔහුට ශාස්ත්‍රානුකූල ගොවිතැනෙහි රස මොනවට වැටහුනේය. එබැවින් හේ තව තවත් උනන්දුවිය.



රත්නායක මහතා පෙළට වී වපුරණ යන්ත්‍රයක් ක්‍රියාකරවයි

1949 යල් මෝසම තුළදී මාතර දිසාපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් වප් මගුල් උත්සවයක් පැවැත්විණි. පළමුවරට සෑහැල්ලු යකඩ නගුලක් පාවිච්චිකොට මුලු අකුණාදු වෙල්යාය ම වී ගොවිතැන සඳහා පිළියෙළ කැරිණි. පැළ සිටුවා කරන ලද ගොවිතැනෙන් එකට විසි පහක පමණ අස්වැන්නක් ලබාගත හැකි විය. කන්ද බඩ පත්තුවේ කෘෂිකර්‍ම තරගයේ මුල්තැන ඔහුට ලැබුනෙන් රුපියල් 100 ත්‍යාගයක්ද දිනාගත හැකි විය.

ඔහු වඩාත් ධෛර්‍යමත් විය. දැන් ඔහුගේ බලාපොරොත්තුව තව තවත් නවීන ගොවිතැන් ක්‍රමවල රස උරගා බැලීමට ය. පේරාදෙණියේ කෘෂිකර්‍ම දෙපාර්තමේන්තුවේ



පේළි අතර වල් නෙලන උපකරණයක් ක්‍රියා කරවයි

අනුග්‍රහයෙන් පුහුණුව ලත් කාන්තාවන් 18 දෙනෙකු ගෙන්වාගෙන ජපන් ක්‍රමයට පැළ සිටුවීමටද අවසථාවක් ලැබුණි. පළමුවරටම ජපන් ක්‍රමයෙන් එකට පණහක විශිෂ්ට අස්වැන්නක් ලබාගත හැකි විය. ඒ වරද කන්දබඩ පත්තුවේ කෘෂිකර්ම තරඟයේ පළමුවැනි ත්‍යාගයවූ රුපියල් 100 දිනා ගැනීමේ භාග්‍යය ඔහු සතු විය.

1956 යල් මෝසමේ දී පේළියට ඇට වැපිරීමේ නව ක්‍රමය අනුගමනය කිරීමෙන් එකෙන් 85 ක පමණ උසස් අස්වැන්නක් ලබාගත්තා පමණක් නොව ඒවර පළමුවැනි ත්‍යාගය වූ රුපියල් 100 හා වීඩරයද දිනා ගන්නා ලදී.

1956-57 මාස් මෝසමේ ගොවි තරඟය ඉතා තියුණු විය. මෙතෙක් ලබන ලද අත් දැකීම් වලින් හා ජයග්‍රහණයන්ගෙන් උද්දාම වූ හෙතෙම මේ වරද ජයගැනීමේ බලවත් අධිෂ්ඨානය ඇතිව තරඟ බිමට බටුයේය. කෘෂිකර්ම උපදේශක මහතුන්ගෙන් තව තවත් උපදෙස් ලබමින් කරන ලද එම තරඟයෙන් ඔහු ලබාගත්තේ විශිෂ්ට ජය ග්‍රහණයකි. එකෙන් සියක පමණ උසස් අස්වැන්නක් ලබාගැනීමෙන් ඔහුට විශිෂ්ට වාර්තාවක්ද පිහිටුවා ලීමට හැකිවිය. 1957 යල් මෝසමේ තරඟයෙන්ද පළමුවැනි ත්‍යාගය හිමිකරගත් හෙතෙම එකෙන් 90 වක පමණ අස්වැන්නක් ලබා ගත්තේය.

පළාතේ ගොවිකම් උපදේශක මහතාගේ උපදෙස් පරිදි 1957-58 මාස් මෝසමේදී හෙතෙම පෞද්ගලික නුමුහුන් බිත්තර වී ගොවි පොළක් වගා කළේය. මේ සඳහා තෝරා ගන්නා ලද්දේ මුරුංගාකායන් 302 නුමුහුන් වී වර්ගයයි. පේළියට ඇට වපුරා වගා කරන ලද ගොයම නියඟයට මෙන්ම අධික වර්‍ෂාපතනයටද අසුවූ නමුදු එකෙන් 90 ක පමණ උසස් අස්වැන්නක් ලබාගත හැකිවීල.

අප ගොවියාගේ දක්‍ෂකම් සීමාවූයේ මඩ ගොවිතැනටම පමණක් නොවේ. ගොඩ ගොවිතැන කෙරෙහිද ඔහු දක්වූයේ බලවත් උනන්දුවකි. 1949 මැයි මාසයේදී පැවැත්වුනු කන්දබඩ පත්තුවේ කෘෂිකර්ම මහා ප්‍රදර්ශනයේදී ආදර්ශ ගොවිපළවල් පිළිබඳ පළමුවැනි ත්‍යාගය මෙන්ම ධාන්‍ය වර්ග පිළිබඳ තුන්වැනි ත්‍යාගයද ඔහුට දිනාගත හැකි වූයේ දෘඪ උත්සාහයේ හා නවීන ගොවිතැන් ක්‍රම පිළිපැදීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

ගොවිතැනෙන් ඔහු ලද විශිෂ්ට ජයග්‍රහණයන් ගැන මෙතෙක් සවන් දුන් අපි ප්‍රීතියෙන් උද්දාම වීමු. කලකට පෙර පොල් අතු සෙවිලි කළ කුඩා ගෙයක විසූ අපේ වීර ගොවියා අද ඉතා පියකරු නිවසක ප්‍රීතියෙන් ජීවත් වෙයි. ඔහුගේ භාර්‍යාව මෙන්ම දරු කැළද ගොවිතැනින් ඉමහත් ආස්වාදයක්

ලබන බව ඔවුන්ගේ සිනහමුසු ප්‍රීතිමත් මුහුනින් මොනවට පිළිබිඹුවෙයි. 'මගේ දූ දරුවන් අනාගතයේදී ආදර්ශමත් ගොවීන් වනු දැක්ම මගේ එකම ප්‍රාර්ථනාවය යැ'යි ඔහු කියන්නේ අනුන් සතුටු කිරීමේ පුහු අදහසකින් නොවේ. ගොවිතැනින් ඔහු ලද ප්‍රීතියත්, ආස්වාදයත්, නිවහල් බව හා නීරොග දිවියත් සිය දරුවන්ටද ලබාදීමේ පරම හැඟීමකිනි.

සමාජ ජීවිතය මෙන්ම සමාජ සේවයද ප්‍රිය කරන රත්නායක මහතා පළාතේ සමිති සමාගම්වල නිලතල රැසක්ද උසුලයි. ගොවිතැනෙන් සිය දිවිය යහමගට හරවාගත් අපේ මේ වීර ගොවියා සැබවින්ම ආදර්ශමත් ගොවියෙකි. පළාතේ සෙසු ගොවීන්ද ඔහුගේ ආදර්ශය අනුගමනය කරන්නේ නම් ඔවුනටද ගොවිතැනෙහි නියම රසාස්වාදය ලබාගත හැකිවනු නිසැකය.



ගොවි මහතා සිය දරුවන් සමඟ